06. **2021 වසරේ ශ්‍රී ලංකාවේ ආනයනවල සංයුතිය 2 හි දක්වා ඇත. එහිවේ දක්වා ඇති දත්ත පදනම් කර ගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**


වගුව 2, 2021 ශ්‍රී ලංකාවේ ආනයන සංයුතිය (ඇමරිකානු ඩොලර් මිලියන වලින්)

ආනයන සංයුතිය	වටිනාකම (ඇමරිකානු ඩොලර් මිලියන වලින්)
සකස් කරන ලද භාණ්ඩ	5977
යන්ත්‍රෝපකරණ සහ වාහන උපකරණ	3976
ඛනිජ, ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය සහ ආශ්‍රිත ද්‍රව්‍ය	3743
රසායනික හා ආශ්‍රිත නිෂ්පාදන	2848
ආහාර සහ සජීවී සතුන්	2275
බොරතෙල් හැර ආහාරයට ගත නොහැකි දල ද්‍රව්‍ය	585
වෙනත්	1333
මුළු	20637

මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහා බැංකුව, වාර්ෂික වාර්තාව, 2022,

(i) 2021 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ආනයන සංයුතිය දැක්වීම සඳහා වලව 2හි දැක්වෙන දත්ත පහදුම් කර ගෙඩීන් මෙහෙන ලද වෘත්ත ප්‍රස්තාරය (පයි ප්‍රස්තාරය) අඳින්න.

ආනයන සංයුතිය	වටිනාකම (ඇමරිකානු ඩොලර් මිලියන වලින්)	%	360°
සකස් කරන ලද භාණ්ඩ	5977	29/50	104
යන්ත්‍රෝපකරණ සහ ප්‍රවාහන උපකරණ	3976	19	68
බනිජ, ඉන්ධන, ලිහිසි තෙල් සහ ආශ්‍රිත ද්‍රව්‍ය	3743	18	65
රසායනික හා ආශ්‍රිත නිෂ්පාදන	2848	14	50
ආහාර සහ සජීවී සතුන්	2275	11	40
බොරතෙල් හැර ආහාරයට හෝ නොහැකි දල ද්‍රව්‍ය	585	3	11
වෙනත්	1333	6	22
මුළු	20637	100	360



ලකුණු දීමේ පිළිවෙළ

ශෙනය නිවැරදි	ලකුණු 02 යි
නිවැරදි නිර්මාණය	ලකුණු 04 යි
අවරෝහණ ක්‍රමය	02 යි
වර්ණ ගැන්වීම	01 යි
සමස්ථය	01 යි
මාතෘකාව	ලකුණු 0.5 යි
මූලාශ්‍රය	ලකුණු 0.5 යි
යතුර	ලකුණු 1 යි

CamScanner

(ii) ඔබ විසින් අඳින ලද ප්‍රස්තාරය පදනම් කර ගනිමින් ශ්‍රී ලංකාවේ ආනයන සංයුතියෙහි කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

- 2021 දී ශ්‍රී ලංකාවේ මුළු ආනයන වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 20637 කි. මින් 29% ක් නිෂ්පාදිත භාණ්ඩ ආනයනය කිරීම සඳහා වෙන් කෙරේ.
- ශ්‍රී ලංකාවේ අඩුම ආනයන ප්‍රමාණය 3% ශ්‍රී ලංකාව තුළ බොරතෙල් ද්‍රව්‍ය ආහාරයට ගත නොහැකි අපනයන ඉන්ධන ආනයනය කිරීමට යොදා ගනී.
- නිෂ්පාදිත භාණ්ඩල යන්ත්‍රෝපකරණ සහ ප්‍රවාහන උපකරණ සහ බහිජ ඉන්ධන ලිහිසි තෙල් සහ ඒ ආශ්‍රිත ද්‍රව්‍ය සඳහා වන ආනයන වියදම මුළු ආනයනයෙන් 66% කි.
- 2021 දී ආහාර සහ සජීවී සතුන් සඳහා වන ආනයන වියදම (11%) බොරතෙල් ද්‍රව්‍ය ආහාරයට ගත නොහැකි අපනයන ඉන්ධන (3%) සහ අනෙකුත් (6%) ශ්‍රී ලංකාවේ මුළු අපනයනයෙන් 20% ක් ලෙස ඉහා පහළ මට්ටමක පවතී.

(iii) වගුව 2හි දැක්වෙන දත්ත නිරූපණය සඳහා භාවිත කළ හැකි වෙනත් ප්‍රස්තාරික ක්‍රමයක් කවු සටහන් සහිතව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

මේ සඳහා සුදුසු ප්‍රස්තාර වර්ග දෙකක් පවතියි


1 සරළ තීරු ප්‍රස්තාරය
2 සංයුක්ත තීරු ප්‍රස්තාරය


සරළ තීරු ප්‍රස්තාරය

මෙමගින් එක් විචල්‍යයක් පහසුවෙන් නිරූපණය කල හැකිවන අතර සිරස් අක්ෂයෙන් ආනයන වල වටිනාකමත් තිරස් අක්ෂයේ ආනයන වර්ගත් වෙන් වෙන් වශයෙන් තිරූපනය කළ හැකිය

එම ප්‍රස්තාරය තිරස් හෝ සිරස් වශයෙන් තීරු නිර්මාණය කළ හැකි වන අතර කුමන ආකාරයෙන් නිර්මාණය කළද වෙන් වෙන්ව විචල්‍යයන් දැක්විය හැකි වීම පහසුය

භාවිතා කිරීමට 1
කවු සටහනට 1
ඉතිරි ලකුණු 2 විස්තරය සඳහා.





සංයුක්ත තීරු ප්‍රස්තාරය

විචල්‍යයේ සමස්ථ වටිනාකම නිරූපනය සඳහා සිරස්ව හෝ තිරස්ව එක් තීරුවක් නිර්මාණය කල යුතුවේ. එමගින් සමස්ථය පෙන්වන අතර එහි දායකත්වය දරණ කොටස් වල එකතුවෙන් සමස්ථය සකස් වල ආකාරය නිරූපනය හැකිය මේ සඳහා ප්‍රතිශත අගයන් භාවිතයට ගැනීම වඩා සුදුසුය මෙහි සරල බවක් පැවතියද එක් තීරුවක් මගින් දැක්වීම නිසා සරල තීරු ප්‍රස්තාරය තරම් අලංකාරව නිර්මාණය කළ නොහැකිය.

CamScanner

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / [All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)

භූගෝල විද්‍යාව புவியியல் Geography	II II II	22 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමෙන් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමෙන් යොදාගන්න.

උපදෙස් :
* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්වත්** තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.


I කොටස - භෞතික භූගෝල විද්‍යාව

1. (i) ජලගෝලයෙහි ජලය ව්‍යාප්තිය පවතින ආකාර **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   (ii) ජල චක්‍රයේ රූප සටහනක් ඇඳ, එහි දැක්වෙන ඕනෑම අවස්ථා **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)
   (iii) පෘථිවි තලය කෙරෙහි ජල චක්‍රයේ බලපෑම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
   (iv) ශ්‍රී ලංකාවේ ජල සම්පත් සංරක්ෂණය සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

2. (i) වායුගෝලීය පද්ධතිය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)
   (ii) වායුගෝලීය පද්ධතියේ ඕනෑම ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 06 යි)
   (iii) වායුගෝලය මිනිසාට බලපාන ආකාරය නිදසුන් **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
   (iv) අහිතකර මිනිස් ක්‍රියාකාරකම් මගින් වායුගෝලයට ඇතිවන බලපෑම් නිදසුන් **තුනක්** ඇසුරින් කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

3. ගංගාවක දික් පැතිකඩක් පහත රූපයෙන් දැක්වේ.

ගංගාවක දික්පැතිකඩ




   (i) ඉහත රූපයේ Ⓐ, Ⓑ සහ Ⓒ ලෙස දක්වා ඇති අදියර නම් කරන්න. (ලකුණු 03 යි)
   (ii) Ⓐ, Ⓑ සහ Ⓒ යන අදියරවලදී ගංගාවේ ක්‍රියාකාරිත්වයේ ස්වභාවය කෙටියෙන් වෙන් වෙන් ව විස්තර කරන්න. (ලකුණු 06 යි)
   (iii) ඉහත 3(i) හි සඳහන් කළ එක් එක් අදියරයන්හි ගංගා ක්‍රියාකාරිත්වය මගින් නිර්මාණය කරන භූ රූප **එක** බැගින් සුදුසු රූප සටහන් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06 යි)
   (iv) පැතිකඩෙහි Ⓒ අදියරේ දී ගංගාවක් මිනිසුන්ට ප්‍රයෝජනවත් වන්නේ කෙසේදැයි උදාහරණ **දෙකක්** ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි)

CamScanner


4. (i) තෙත් බිමක් යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)
(ii) තෙත් බිම් පරිසර පද්ධතියකින් ලැබෙන ප්‍රධාන වාසි **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)
(iii) මානව ක්‍රියාකාරකම් නිසා තෙත් බිම් ආශ්‍රිතව උද්ගතවී ඇති ගැටලු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
(iv) තෙත් බිම් සංරක්ෂණය සඳහා ශ්‍රී ලංකා රජය විසින් අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග **තුනක්** කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

5. **(A)** සහ **(B)** රූපවලින් ජනසංඛ්‍යා පිරමීඩ වර්ග දෙකක් දැක්වේ. ඒවා පදනම් කර ගෙන පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(A)



(B)


(i) ජනසංඛ්‍යා පිරමීඩයක් යනු කුමක් ද? (ලකුණු 02 යි)
(ii) **(A)** රූපයට සමාන ජනසංඛ්‍යා පිරමීඩයක් සහිත රටක ජනසංඛ්‍යාවේ ඇති ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)
(iii) **(B)** රූපයට සමාන ජනසංඛ්‍යා පිරමීඩයක් සහිත රටක ජනසංඛ්‍යාවේ ඇති ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)
(iv) **(A)** සහ **(B)** රූපවලින් දැක්වෙන ජනසංඛ්‍යා පිරමීඩ සහිත රටවල් මුහුණ දෙන ගැටලු **තුන** බැගින් කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

6. (i) හරිත විප්ලවය සහ ජෛව්දීය කෘෂිකර්මය අතර ඇති වෙනස කුමක් ද? (ලකුණු 02 යි)
(ii) හරිත විප්ලවයෙහි ඕනෑම ප්‍රධාන සංරචක **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)
(iii) හරිත විප්ලවයෙහි අවාසි **තුනක්** කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)
(iv) ජෛව්දීය කෘෂිකර්මයෙහි වාසි **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

CamScanner

7. පහත 1 රූප සටහන මගින් ශ්‍රී ලංකාවට සංචාරකයින්ගේ පැමිණීම 2001 - 2022 නිරූපණය වේ.

රූප සටහන 1 : ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව, 2001 - 2022



මූලාශ්‍රය : *ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, 2023*

(i) ශ්‍රී ලංකාවට සංචාරකයින් ආකර්ෂණය කරන ප්‍රධාන සංචාරක පදනම් **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඉහත 1 රූප සටහනෙහි නිරූපිත පරිදි ශ්‍රී ලංකාවට සංචාරකයින්ගේ පැමිණීමෙහි ප්‍රවණතා **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ඔබ ඉහත 7 (ii) හි සඳහන් කළ ප්‍රවණතාවලට පාදක වූ හේතු **තුනක්** විමසන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනයට සංචාරක කර්මාන්තය දායක වී ඇති ආකාරය උදාහරණ **තුනක්** සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

8. පහත වගුව 1 මගින් කලාපීය වශයෙන් ලෝකයේ පෙට්‍රෝලියම් සංචිත ව්‍යාප්තිය දක්වයි.

වගුව 1 : 1992 සිට 2020 දක්වා කලාපීය වශයෙන් ලෝකයේ පෙට්‍රෝලියම් සංචිත ව්‍යාප්ති රටාව, (මුළු සංචිතයෙහි ප්‍රතිශතයක් වශයෙන්)

ලෝකයේ කලාප	1992	2002	2012	2020
මැදපෙරදිග	63.7	56.1	48.4	48.3
දකුණු සහ මධ්‍යම ඇමෙරිකාව	7.6	7.6	19.7	18.7
උතුරු ඇමෙරිකාව	11.7	17.3	13.2	14.0
යුරෝපය සහ පොදුරාජ්‍ය මණ්ඩලීය නිදහස් රටවල් (CIS)	7.5	8.3	8.4	9.2
අප්‍රිකාව	5.9	7.6	7.8	7.2
ආසියා ඉන්තිකර	3.6	3.1	2.5	2.6
ලෝකය	**100.0**	**100.0**	**100.0**	**100.0**

මූලාශ්‍රය : *https://www.statista.com*

(i) නිෂ්පාදන කර්මාන්ත සහ නිෂ්කර්ෂක කර්මාන්ත අතර වෙනස කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ඉහත 1 වගුවේ දත්ත පරිශීලනය කරමින් ලෝකයේ පෙට්‍රෝලියම් සංචිත ව්‍යාප්ති රටාවේ ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ලෝක පෙට්‍රෝලියම් වෙළඳාමෙහි කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** විමසන්න. (ලකුණු 06 යි)

(iv) ලෝකයේ නිෂ්කර්ෂක කර්මාන්ත ආශ්‍රිත ගැටලු **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

* * *

CamScanner


(i) ජල ගෝලයෙහි ජලය වහාප්තව පවතින ආකාර දෙකක් සඳහන් කරන්න.

සාගර, මුහුදු, විල්, ගංගා ජලය ආදියේ ඇතුලත් ඉසුලිය ජලයෙන් හා භූගත ජලයෙන් සමන්විත සමස්ත ජල ස්කන්ධය ජල ගෝලීය පද්ධතිය ලෙස හැඳින්වේ. භූගත ජලය මතුපිට තලයට යටින් පිහිටා ඇත. පෘථිවියට ජලය ලැබීම වායුගෝලය හා පොළොව තුළ ඇතිවූ කාරක ක්‍රියාදාමයක ප්‍රතිඵලයකි. එම ක්‍රියාවලිය අදියර කිහිපයක් ඔස්සේ සිදුවේ. එවා ජල චක්‍රයේ ප්‍රධාන සංරචක වේ. ජල චක්‍රය යනු සූර්ය ශක්තිය ආධාරයෙන් ජලය එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට වලාකාරයෙන් සංසරණය වන ක්‍රියාවලියකි.

(ලකුණු 02)

(ii) ජල චක්‍රයේ රූප සටහනක් ඇඳ, එහි දක්වෙන ඕනෑම අවස්ථා දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

ජල චක්‍රය



ජල චක්‍රයේ ප්‍රධාන සංරචක

- වාෂ්පීකරණය
- උත්ස්වේදනය
- සනීභවනය
- වර්ෂණය
- අධිධාවනය
- කාන්දු වීම හා වැස්සීම

වාෂ්පීකරණය : ද්‍රව අවස්ථාවේ පවතින ජලය වායු අවස්ථාවට පත්වීමේ ක්‍රියාවලිය වාෂ්පීකරණය යි. පෘථිවි තලයේ ඇති ජලය වායුගෝලයට යොමු වන්නේ වාෂ්පීකරණය මගිනි.

සනීභවනය : වායු අවස්ථාවේ පවතින ජලය සන බවට පත්වීමේ ක්‍රියාවලිය සනීභවනය යි. වායුගෝලීය ප්‍ර ගෙඩාව තුල ඒවා ජල වාෂ්ප ලෙස පවතී. මේවා ජල අංශු බවට පත් වී වලාකුළු ලෙස පවතී.

වර්ෂණය : ජලය සනීභවනය වන විට ජල අංශුවල ප්‍රමාණය වියාල වී ඒවා පොළොවට පතිත වීම වර්ෂණ යි.

අධිධාවිතය : වර්ෂණයෙන් ලැබෙන ජලයෙන් කොටසක් භූමිය මතුපිටින් ගලායන අතර, එය අධිධාවිත ලෙස හඳුන්වයි.

කාන්දුවීම හා වැස්සීම . වර්ෂණයෙන් ලැබෙන වැස්සීම තුළින් භූගත ජලයට එකතුවීමේ ක්‍රියාවලිය කාන්දුවීම හා වැස්සීම ලෙස හඳුන්වයි.

(iii) පෘථිවි තලය තෙරෙහි ජල චක්‍රයේ බලපෑම් කුමක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

- පෘථිවි තලය තෙරෙහි ජලචක්‍රය විවිධාකාරයෙන් බලපෑම් එල්ල කරයි. ඒ අනුව භූ දර්ශන නිර්මාණයේ ප්‍රධාන කාරකය ලෙස ජල චක්‍රය ක්‍රියාත්මක වේ.
- එය පෘථිවිය මත උෂ්ණත්වය නියතව තබා ගැනීමටත්, ජීවීන්ගේ ව්‍යාප්තිය සඳහාත් මෙහෙයක් ඉටු කරයි.
- ජලය වාෂ්පීකරණය හා සනීභවනය වීම මගින් වර්ෂණය ඇති වීමෙන් භූ දර්ශනයට වැඩි බලපෑමක් ඇති කරයි.
- අධික වාෂ්පීකරණය මගින් ලවණීකරණය වැඩි වී වෘක්ෂලතා සහත්වය අඩු වේ. (කාන්තාර ප්‍රදේශ ආශ්‍රිතව)
- හිතකර පරිසර තත්ත්වයන් ඇති කිරීමෙන් ශාක හා සතුන්ගේ වර්ධනයට හේතු වේ.
- ජීවීන්ගේ සියලුම ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ජලය සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය මෙමගින් සිදුවේ.
- අන්තගාමී දේශගුණ තත්ත්වයන් වන නියගය හා අධික වාෂ්පීකරණය වැනි තත්ත්වයන් නිසා දේශගුණික වෙනස්වීම් තුළින් ජල සම්පතට බලපෑම් එල්ල කරයි.
- කාර්යක්ෂම අයුරින් ජල භාවිතය.

(iv) ශ්‍රී ලංකාවේ ජල සම්පත් සංරක්ෂණය සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග කුමක් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

- අධි ජල භාවිතය අවම කිරීම.
- ගෘහස්ථ කටයුතුවලට ජලය භාවිතයේ දී නාස්තිය අවම කිරීම.
- නව තාක්ෂණික මෙවලම් භාවිතයෙන් භාවිත කළ ජලය නැවත භාවිතා කිරීම.
- වැසි ජලය භාවිතය ප්‍රචලිත කිරීම.
- කෘෂිකර්මාන්තයේ දී මතා ජල කළමනාකරණ ක්‍රමශිල්ප භාවිතය.
- නව ජලසම්පාදන ක්‍රම භාවිතයෙන් අවම ජල සැපයුමක් තුළින් ඉහළ අස්වැන්නක් ලබාගැනීම.
- කාර්මික කටයුතුවල්දී සිදුවන ජල නාස්තිය අවම කිරීම.
- ගෘහස්ථ අපජලය සුදුසු පරිදි නැවත භාවිතයට ගැනීම.
- රසායනික පොහොර, කෘමිනාශක සහ වල්නාශක භාවිතය සඳහා ප්‍රමිතියට අනුකූලව කටයුතු කිරීමට යොමු කිරීම.
- නීතියට පටහැනිව ජල භාවිතා කරන්නන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම.
- වැලි ගොඩදැමීම, පතල් කැණීම සහ මැටි නිස්සාරණය පිළිබඳව විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.
- ජල දූෂණය අවම කිරීම.
- 3R සංකල්පයට අනුගතව ජල භාවිතය හා සංරක්ෂණය. (Reduce අවම කිරීම, Reuse – නැවත භාවිතය, Recycle – ප්‍රතිචක්‍රීකරණය)

CamScanner

2. (i) වායුගෝලීය පද්ධතිය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

භෞතික පද්ධතියේම කොටසක් ලෙස වායුගෝලය දැක්විය හැකිය.

පෘථිවියේ ගුරුත්වාකර්ෂණ ශක්තිය මඟින් පෘථිවි තලය හා බැඳී පවතින, විනිවිද පෙනෙන, නිර්ගන්ධ (odourless) වායු ආවරණය වායු ගෝලය ලෙස හැඳින්වේ.

(ලකුණු 02)

(ii) වායුගෝලීය පද්ධතියේ ඕනෑම ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

- එය පොළෝ තලයේ සිට උපරිම වශයෙන් කි.මී. 10,000 ක් පමණ ඉහළට විහිදෙන බව සාමාන්‍ය පිළිගැනීම වේ.
- වායු ගෝලයේ කාලගුණික සංසිද්ධි ඇතිවන සීමාවසමකාසන්න ප්‍රදේශවල කි.මී. 16 ක් පමණ දක්වාත් ධ්‍රැවසාන්න ප්‍රදේශවල කි.මී. 8 ක් පමණ දක්වාත් සිරස් ලෙස විහිදේ.
- වායු ගෝලයේ පීඩනය මුහුදු මට්ටමේ සිට ඉහළට යත් ම නොකඩවා ශීඝ්‍රයෙන් අඩු වේ.
- පොළෝ තලයේ සිට ඉහළට යනවිට වායුගෝලයේ උෂ්ණත්ව වෙනස්වීම තරමක් සංකීර්ණ ය.
- එම උෂ්ණත්ව වෙනස් වීම් සිදු වීම අනුව වායුගෝලය පැහැදිලි ස්ථර හතරකට බෙදා දක්වනු ලැබේ. පරිවර්තීගෝලය අපරිවර්තීගෝලය මෙසෝගෝලය තාපගෝලය

(1.5 X 4 = ලකුණු 06)

(iii) වායුගෝලය මිනිසාට බලපාන ආකාරය නිදසුන් තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

- පද්ධතියක් ලෙස පෘථිවියට වඩාත් සමීප මෙන් ම වැදගත් වන්නේ පරිවර්තීගෝලය යි. කාලගුණික ක්‍රියාවලි පොළෝතලයේ සිට කි.මී. 16 ක් පමණ වූ කලාපයකට සීමා වීම එයට ප්‍රධාන හේතුව වේ.
- වායුගෝලය ජීවයේ පැවැත්මට අත්‍යවශ්‍ය සාධකයකි.
- O3 ස්තරය මඟින් පාරජම්බුල කිරණ පාලනය කිරීම ද වැදගත් වේ.
- අපරිවර්තීගෝලය තුළ දී පෘථිවිය කරා එන ග්‍රහක වස්තූන් දැවී යාමට ලක් වීම ද වැදගත් සංසිද්ධියකි.
- වායු ගෝලයේ ඇතිවන කැළඹිලි: ටොනාඩෝ වැනි ක්‍රියාකාරකම් මිනිසාට බලපායි.
- කාලගුණික වෙනස්වීම් : ගංවතුර,ග්ලැසියර් දියවීම, නියඟ වැනි ක්‍රියාකාරකම් මිනිසාට විවිධ අයුරින් බලපායි.

(03 X 2 = ලකුණු 06)

(iv) අභිතකර මිනිස් ක්‍රියාකාරකම් මඟින් වායු ගෝලයට ඇති වන බලපෑම නිදසුන් තුනක් ඇසුරින් සාකච්ඡා කරන්න

1. හරිතාගාර වායු විමෝචනය:

පොසිල ඉන්ධන දහනය කිරීම (ගල් අඟුරු, තෙල්, ස්වාභාවික වායු) කාබන් ඩයොක්සයිඩ් (CO2) සහ අනෙකුත් හරිතාගාර වායු මුදා හැරීම ගෝලීය උණුසුම, වෙනස් වූ කාලගුණ රටා සහ වඩාත් ආන්තික කාලගුණික සිදුවීම් වලට තුඩු දෙයි

2. ඕසෝන් ක්ෂය වීම:

ඕසෝන් ක්ෂය වන දුවය භාවිතය (සීඑෆ්සී, හැලෝන්) මෙම දුවය බිඳවැටීම ක්ලෝරීන් සහ බ්‍රෝමීන් මුදා හරියි. ඕසෝන් ස්ථරය ක්ෂය වීම, පාරජම්බුල කිරණ වැඩි වීම සහ සමේ පිළිකා අවදානම

3. වායු දූෂණය:

කාර්මික ක්‍රියාවලීන්, කෘෂිකර්මාන්තය සහ ප්‍රවාහනය මගින් දූෂක මුදා හරියි - සල්ෆර් ඩයොක්සයිඩ් (SO2), නයිට්‍රජන් ඔක්සයිඩ් (NOx), අංශු දුවය (PM) සහ වාෂ්පශීලී කාබනික සංයෝග (VOC) විමෝචනය කිරීම

දූමාරය, ශ්වසන ගැටළු, අම්ල වැසි සහ පාරිසරික හානි සඳහා දායක වේ

වනහරණය: ගිනිතැබීම් නිසා වායුගෝලය දූෂණය වීම.

කාර්මිකරණය: පෙට්‍රෝලියම්, පොසිල ඉන්ධන දහනය මගින්මගින් වායුගෝලය දූෂණය කරයි.


කෘෂිකාර්මික ක්‍රියාකාරකම්: කෘෂිකර්මයට යොදාගන්නා රසායනික ද්‍රව්‍ය පරිසරයට එක්වීම.

සත්ව පාලනය: වමාරා කන සතුන් විසින් සිදුකරන වායු විමෝචනය.

(03 X 2 = ලකුණු 06)

03. i. පහත දක්වා ඇති ගංගාවේ දික් පැතිකඩෙහි A, B සහ C ලෙස දක්වා ඇති අවධීන් නම් කරන්න. (ලකුණු 03)

ගංගාවක දික්පැතිකඩ



1. යෞවන අවස්ථාව
2. පරිණත අවස්ථාව
3. වෘද්ධ අවස්ථාව

(01 X 1 = ලකුණු 03)

ii. 'A', 'B' සහ 'C' යන අදියරවල ගංගා ක්‍රියාවලියේ ස්වභාවය අනුපිළිවෙලින් කෙටියෙන් විස්තර කරන්න.

1 යෞවන අවස්ථාව:
- බැවුම වැඩි ය.
- ජල ප්‍රමාණය අඩු ය.
- ජලයේ ප්‍රවේගය වැඩි ය.
- සංසර්ෂණය ඉහළ ය.
- බාදන භූ රූප බහුල ව නිර්මාණය වේ.

2 පරිණත අවස්ථාව:
- බැවුම ක්‍රමයෙන් අඩු වේ.
- අතු ගංගා රැසක් එකතු වීම නිසා ජල ප්‍රමාණය වැඩි ය.
- එබැවින් ඉවුරු බාදනය (ආංශික සංසර්ෂණය) සිදු වේ.
- මේ නිසා ගඟේ පළල වැඩි වේ.
- ගඟේ භාරය පරිවහනය කිරීමට ශක්තිය වැඩි වෙයි


3 වැද්ධ අවස්ථාව
- ගංගාවේ අනුක්‍රමණය ඉතා අඩු ය.
- ජල ප්‍රමාණය අධික ය.
- ජලය සෙමෙන් ගලා යයි.
- ගංගා භාරය අධික ය.
- නිධිසාධන ක්‍රියාවලිය සිදු වෙයි

(2 X 3 = ලකුණු 06)

iii. ඉහත 3 (i) හි සඳහන් කළ එක් එක් අදියරයන්හි ගංගා ක්‍රියාකාරිත්වය මගින් නිර්මාණය කරන භූ රූප එක බැගින් සුදුසු රූප සටහන් ඇසුරින් විස්තර කරන්න.

A බාදින භූ රූප

1. V හැඩ නිම්නය
2. ගල්වන
3. දොරු
4. නෙත්ති නෙරු
5. ~~ගංමෙළු~~
6. දියඇලි (පසුගාමී දියඇලි)




B අදියරයේ භූ රූප

1. පුළුල් V හැඩ නිම්නය
2. ~~ගංමෙළු~~ ගංතීර/ගඟබැම්ම
3. හැඩපළු ගංගා
4. ගං දඟර

C අදියරයේ නිධි සාධනය ආශ්‍රිත භූ රූප

1. ~~ගං~~-දඟර
2. දුනු විල
3. දියළු අවාන්
4. ගංකණ්ඩි
5. පිටාර තැන්න
6. ඩෙල්ටා

(2 X 3 = ලකුණු 06)






නැවපෙළ ගංගා


ඩෙල්ටා

Arcuate වාපාකාර (නයිල් ගඟ)



Estuarine සුනිල මෝය

(පේපර් ගඟ)



iv. පැනිකඩෙහි (C) අදියරේ දී ගංගාවක් මිනිසුන්ට ප්‍රයෝජනවත් වන්නේ කෙසේදැයි උදාහරණ දෙකක් ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 04)

1. **වැලි හා අවසාදිත තැන්පත් කිරීම:** ගංගා මුඛයේ බොහෝ විට වැලි සහ අවසාදිත තැන්පත් කරයි. වැලි තීරු, ඩෙල්ටා සහ වෙරළබඩ භූමි සෑදීමට ඒවා දායක වේ.

2. **වැලි නිස්සාරණය:** ගංගා පතුලෙන් හා ඉවුරු වලින් වැලි වාණිජමය වශයෙන් උකහා ගැනීම.

3. **ගංවතුරෙන් පසු ගංඉවුරු සශ්‍රීක වීම:** ගංවතුරකින් පසු, ගංවතුර නිසා තැන්පතුවූ බිම් සශ්‍රීක වන අතර වගා කිරීම සඳහා සුදුසු වේ. 'කීර කොටු' බහුතරයක් බහුලව දක්නට ලැබෙන්නේ මෙම තැන්පතුවලය.

4. **මසුන් ඇල්ලීම:** මසුන් ඇල්ලීම ගංගා මුඛදොරවල සිදු කරනු ලැබේ.

5. **විනෝදාස්වාදය:** ගංගා මුවදොර ආශ්‍රිව පිහිනීම, මසුන් ඇල්ලීම, බෝට්ටු පැදීම සහ වෙරළ සංචාර වැනි විනෝදාත්මක ක්‍රියාකාරකම් සඳහා ජනප්‍රිය ස්ථාන වේ. බොහෝ අය මෙම ප්‍රදේශවල දර්ශනීය සුන්දරත්වය සහ ජලය මත පදනම් වූ ක්‍රියාකාරකම් භුක්ති විඳිති.

6. **සංචාරක ව්‍යාපාරය:** ගංගා මුවදොර ආශ්‍රිතව, ඒවායේ දර්ශනීය භූ දර්ශන සහ විවිධ පරිසර පද්ධති සමඟ සංචාරකයින් ආකර්ෂණය කරයි. මෙම ප්‍රදේශවල සංචාරක ක්‍රියාකාරකම් අතර, කුරුල්ලන් නැරඹීම සහ වෙනත් සොබාදහම හා සම්බන්ධ ක්‍රියාකාරකම් ඇතුළත් විය හැකිය.

7. **ගංවතුර පාලනය:** ගංවතුර කළමනාකරණය කිරීමේදී ගංගා මුවදොර විශාල කාර්යභාරයක් ඉටු කරයි. සාගරයට ළඟා වන විට ගංගාව පුළුල් වී ගංවතුර විසුරුවා හැරීමට උපකාරී වන අතර, ගංගාවෙන් ඉහළ ප්‍රදේශවල ගංවතුර අවදානම අඩු කරයි.

8. **සංස්කෘතික වැදගත්කම:** ගංගා මුවදොර විවිධ ප්‍රජාවන් සඳහා සංස්කෘතික වැදගත්කමක් පැවතිය හැකිය, බොහෝ විට ඓතිහාසික සිදුවීම් මිනිසුන් හෝ සම්ප්‍රදායන් සමඟ ඒවා සම්බන්ධ වේ. ඇතැම් ප්‍රජාවන්ට ගංගා මුවදොර හා සම්බන්ධ අධ්‍යාත්මික හෝ චාරිත්‍ර වාරිත්‍ර පිළිවෙත් තිබිය හැකිය.

9. **ප්‍රවාහණය**

(2.5 x 2 = ලකුණු 05)

04. (i) තෙත් බිමක් යනුවෙන් අදහස් කරනේ කුමක් ද?

වගුරු" ගොහොරු" ජලයෙන් පිරී ගිය ගස් බෙන සහිත ප්‍රදේශ ස්වභාවිකව හෝ තාවකාලික නිශ්චල ස්තරවල ජලය රැඳී තිබෙන නැතහොත් ගලා යන මිරිදිය, කිසුල් ලවණ හෝ කාදිය සහිත ප්‍රදේශ ද ඇතුලත් වන්නා වූ බාදිය අවස්ථාවේදී ගැඹුර මීටර 6 නොඉක්මවන ප්‍රදේශ තෙත්බිම් ලෙස හඳුන්වයි. (රැම්සා)

(ලකුණු 02)

(ii) තෙත් බිම් පරිසර පද්ධතියකින් ලැබෙන ප්‍රධාන වාසි තුනක් කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 06 යි)**

- පෙරව යන පරිසර විද්‍යාත්මක වැදගත්කම: ශාක හා සත්ත්ව වාසභූමි තෙත්බිම් ආශ්‍රිත පැවතීම.
- භූමිය සහ ජලයෙහි සිටින සතුන්ට අවශ්‍ය ආහාර හා සුදුසු වාසයට ආරක්ෂිත ස්ථාන සැලසීම.
- වගුරු බිම් ජලාශ සහ කුඹුරුවලට ජලය අවශෝෂණය කිරීමෙන් ගංවතුර අවම කර ජලාපවහන පද්ධතියේ සමතුලිතතාව පවත්වා ගැනීම.
- වායුගෝලයේ ඇති කාබනික සහ අකාබනික ද්‍රව්‍ය උරාගෙන පරිසරයට හිතකර කාබනික ද්‍ර නිකුත් කිරීම.
- කුණාටු මෘදුකාරී වීමෙන් ආරක්ෂා වීම.
- වදවීමේ තර්ජනයට ලක්ව ඇති ජීවීන්ගේ අවසාන වාසස්ථානු බවට පත්වීම.
- විනෝදාස්වාදය සඳහා මසුන් ඇල්ලීම, දඩයම් කිරීම සහ ක්‍රීඩාප්‍රමෝදන කටයුතු සඳහා යෙ ගැනීම. උදා: බුන්දල
- විවිධ මත්ස්‍ය විශේෂ සඳහා අභිජනන මධ්‍යස්ථාන ලෙස කටයුතු කිරීම.
- අවේනික ජීවීන්ගෙන් 30%ක් පමණ තෙත්බිම් වාසස්ථාන කරගෙන සිටීම.
- සංක්‍රමණ පක්ෂීන්ගෙන් 50%ක් පමණ සෘජුවම තම ආහාර සහ නවාතැන් සඳහා තෙත්බිම් හා කරයි.
- ජලය නිර්මිදූ කිරීමට උපකාරී වේ.

(iii) මානව ක්‍රියාකාරකම් නිසා තෙත් බිම් ආශ්‍රිතව උද්ගතවී ඇති ගැටලු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

- පසුගිය ශතවර්ෂ කිපය තුල තෙත්බිම්වලට දැඩි ලෙස බලපෑම් එල්ල වී ඇත. මිනිස් ක්‍රියාකාරකම් වැඩිවීම සහ ඒවායේ ඍණාත්මක ප්‍රතිවිපාක නිසා පරිසර දූෂණය, හායනය සහ තෙත්බිම් අහිමි වීම ප්‍රධාන ගැටලු වේ.
- ස්වභාවිකව ගලායන ජල මාර්ගවල ගමන් මග හරස් කොට ඉදි කළ වේළි හේතුවෙන් තෙත්බිම් ගොඩකිරීමත්, ඒ මත මිනිස් අවශ්‍යතා උදෙසා විවිධ ගොඩනැගිලි ඉදිකිරීමට යොදාගැනීම, වේළි ඉදිකිරීමෙන් ඊට පහළින් ඇති තෙත්බිම් ගොඩ වී යාම.
- ආක්‍රමණික ශාක නිසා තෙත්බිම්වලට හානි සිදු වීම.
- ශාක කපා ඉවත් කිරීමෙන් තෙත්බිම් විනාශ වී යාම.
- තිරසර නොවන අයුරින් තෙත්බිම් භාවිතය.
- පසුගිය වසර 300ක පටන් කාලය තුළ ලෝකයේ තෙත්බිම්වලින් 87%ක් අහිමි වී ඇති බව අධ්‍යයනවලින් හෙළි වී ඇත. ඊට ප්‍රධාන හේතු වී ඇත්තේ ජනාවාස, කර්මාන්ත හා කෘෂිකර්මාන්තය සඳහා තෙත්බිම් භාවිතය.
- තෙත්බිම් විනාශ වීම යනු එහි වෙසෙන සියලුම ජීවීන්ගේ වාසස්ථාන විස්ථාපනය හෝ විනාශ වීම සිදුවීමයි. අවසානයේ එම ජීවීන් වද වී යාමට ද ලක් වේ.
- ගෝලීය වන සත්ත්ව වෙළඳාම සහ ආවේණික නොවන ශාක හා සතුන් තෙත්බිම් පද්ධති තුළ සංක්‍රමණය නිසා තෙත්බිම්වලට තර්ජන සිදුවීම

- බුණුකන් මෙයම වැදගත් කියාකාරකම් 2 තෙත්බිම්වලට තර්ජනාත්මක.

(iv) තෙත් බිම් සංරක්ෂණය සඳහා ශ්‍රී ලංකා රජය විසින් අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග **තුනක් කෙටියෙන් සාකච්ඡා කරන්න.** (ලකුණු 06 යි)


- ශ්‍රී ලංකා රජය රම්සා සම්මුතියට අනුව කටයුතු කිරීම.
- ශ්‍රී ලංකා තෙත්බිම් ලෝක ලේඛනයට ඇතුලත් කිරීම.
- හානි වැළැක්වීම සඳහා නීති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- අනවසර අල්ලා ගැනීම්, ඉදිකිරීම් මෙන්ම තෙත්බිම් එළිකිරීම් තහනම් කිරීම.
- තෙත්බිම් ආරක්ෂා කිරීම පිලිබඳව ජනතාව දැනුවත් කිරීම.
- ලෝක තෙත්බිම් දිනය සැමරීම.
- පෞද්ගලික අංශය තෙත්බිම් සුරැකීම සඳහා යොමු කිරීම.
- ජාත්‍යන්තර සහයෝගිත්වය හා දේශීය පුද්ගල හා ආයතනවල සහයෝගය තෙත්බිම් ආරක්ෂාවට ලබා ගැනීම.
- ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සක්‍රිය මහජන සහභාගිත්වය ලබා ගැනීම තුලින් තෙත්බිම් ආරක්ෂා කිරීම හා ප්‍රතිෂ්ඨාපනය කිරීම
- 1937 වන සත්ත්ව හා වෘක්ෂලතා ආඥපනත ප්‍රකාරව තෙත්බිම් ආරක්ෂා කිරීම.
- 1984 දී ශ්‍රී ලංකාව කුරුල්ලන් ආරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර කවුන්සලයේ ආසියානු මහද්වීපික අංශයේ කලාපිය සමුළුවට සත්කාරකත්වය දැක්වීම.

1986 ජාතික ජලජ සම්පත් නියෝජිත ආයතනයේ (NARA) ,ස්වභාවික සම්පත් බලශක්ති හා විද්‍යා අධිකාරිය (NARESA) හා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව (CCD) සමග තෙත්බිම් ආරක්ෂා කිරීම.

1989 වනවිට මධ්‍යම පරිසර අධිකාරිය (CEA) විසින් තෙත්බිම් ආරක්ෂා කිරීම සඳහා අන්තර් මෙහෙයුම් කමිටුවක් ස්ථාපිත කිරීම.

II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

5. (A) සහ (B) රූපවලින් ජනසංඛ්‍යා පිරමීඩ වර්ග දෙකක් දැක්වේ. ඒවා පදනම් කර ගෙන පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(i) ජනසංඛ්‍යා පිරමීඩයක් යනු කුමක් ද?

(ලකුණු 02 ක

කිසියම් නිශ්චිත කාලයක (වර්ෂයක) රටක හෝ ප්‍රදේශයක ජන සංඛ්‍යාවෙහි ස්ත්‍රී-පුරුෂ වශයෙන් වයස් කාණ්ඩවල ව්‍යාප්තිය දක්වන ප්‍රස්තාරයකි. රටක හෝ ප්‍රදේශයක ජන සංඛ්‍යාවෙහි ස්ත්‍රී-පුරුෂ වශයෙන් ජන සංයුතිය සන්සන්දනය කිරීමට මෙය යොදා ගැනේ. එසේම ජන සංඛ්‍යාවක ළමා යැපුම් අනුපාතය හෝ විෂයයක් යැපුම් අනුපාතය සෙවීමට මෙය ප්‍රයෝජනවත් වේ.

(ii) (A) රූපයට සමාන ජනසංඛ්‍යා පිරමීඩයක් සහිත රටක ජනසංඛ්‍යාවේ ගති ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 06 යි)

ශීඝ්‍රයෙන් වර්ධනය වන ජන සංඛ්‍යාවක් දක්වන මෙයින් ළමා වයස් කාණ්ඩවල පසුවන අධික සංඛ්‍යාවක් ද වියපත් කාණ්ඩවල අඩු සංඛ්‍යාවක්ද පෙන්වයි. මෙම පිරමීඩයක් හැඳින්වෙන්නේ ප්‍රසාරණය වන ජන සංඛ්‍යාව ව්‍යුහයක් වශයෙනි. වියපත් සංඛ්‍යාව අඩු වීමෙන් පෙනෙන්නේ ආයු අපේක්ෂාව අඩු බවකි. පත්ල බර මෙම වයස් ව්‍යුහය සිරස් අනුව ක්‍රමයෙන් අඩුවන වයස් කාණ්ඩ දක්වයි. මෙය ඉහළ සාපල්‍යතාවයක් හා ඉහළ මෘත්‍යුතාවක් නැත්නම් ඉහළ උපත් ශීඝ්‍රතාවයක් හා ඉහළ මරණ ශීඝ්‍රතාවක් සහිත දියුණු වෙමින් පවතින රටවල වයස් ව්‍යුහයක් පෙන්වයි.

CamScanner

(iii) (B) රූපයට සමාන ජනසංඛ්‍යා පිරමීඩයක් සහිත රටක ජනසංඛ්‍යාවේ ගති ලක්ෂණ කිහිපයක් කෙටියෙන් විස්තර කරන්න.

මෙය ක්‍රමයෙන් අඩුවන ජනසංඛ්‍යාවක් දක්වන වයස් පිරමීඩයකි. සාඵල්‍යතාව ඉතා අඩු මට්ටමක පවතින නෙයින් බාල වයස්කරුවන්ගේ සංඛ්‍යාව අඩුය. ආයු අපේක්ෂාව ඉහළ නිසා ඉහළ වයස් සාපේක්ෂව වැඩිය. මෙම වයස් පිරමීඩය දීර්ඝ කාලයක් තිස්සේ වර්ධනය වී ස්ථාවරත්වයට පත් වූ සංවර්ධිත රටවල තත්ත්වය දක්වන්නකි. ළමා යැපුම් අනුපාත පහළ මට්ටමක පැවතිය ද වියපත් යැපුම් අනුපාතය සාපේක්ෂව ඉහළ මට්ටමක පවතී. (ලකුණු 06)

(iv) (A) සහ (B) රූපවලින් දැක්වෙන ජනසංඛ්‍යා පිරමීඩ සහිත රටවල් මුහුණ දෙන ගැටලු කිහිප බැගින් කෙටියෙන් සාකච්ඡා කරන්න.

A රූපයේ දැක්වෙන වයස් පිරමීඩයක් සහිත රටවල් මුහුණ දෙන ගැටලු

- ජන සංඛ්‍යාව ශීඝ්‍රයෙන් වර්ධනය වන හෙයින් ඒ හා සම්බන්ධ උද්ගතවන ගැටලු දක්නට ලැබේ.
- ළමා යැපුම් අනුපාතය ඉහළ නිසා ඔවුන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වයන් ආරක්ෂා කර ගැනීමට මහත් උත්සහයක් දැරිය යුතුය වේ.
- ළමා වයසේ පසු වන්නන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා පාසල්/ ගුරුවර ගුරුවරියන් ආදි විශාල වශයෙන් අවශ්‍ය වේ.
- ළමා වයස් පසු වන්නේ යෞවන වියට පා තබන විට ඔවුන් සඳහා සේවා නියුක්ති අවස්ථාවන් සැපයිය යුතු වේ.
- එවැනි පහසුකම් සැපයීමට අපහසු වූ දියුණු වෙමින් පවත්නා රටවල නොයෙකුත් ගැටලු මතු වේ.
- ආහාර සඳහා ඉල්ලුම අධික හෙයින් රජයට ඒ සඳහා අධික වියදමක් දැරීමට සිදු වේ.

B රූපයේ දැක්වෙන වයස් පිරමීඩයක් සහිත රටවල් මුහුණ දෙන ගැටලු

- වියපත් අයගේ සංඛ්‍යාව සාපේක්ෂව ඉහළ නිසා ඒ ආශ්‍රිත ගැටලු බහුලය.
- වයස් ගත වූවන් සඳහා රජය විසින් නොයෙකුත් සේවා සැපයීමට සිදු වේ.
- එම රටවල පවත්නා පවුල් සංස්ථාව ස්වභාවය අනුව දරුවන් ඔවුන් රැක බලා ගැනීම විරල හෙයින් ඔවුන් සඳහා සේවා සැපයීමට රජයේ වගකීමක් බවට පත්ව ඇත.
- වියපත් අය සඳහා විශේෂ සෞඛ්‍ය පහසුකම්-රක්ෂණ සේවා සැපයිය යුතු ය.
- බාල වයස්කරුවන් අඩු නිසා ශ්‍රමබලකායට එක්වන සංඛ්‍යාවද අඩුය.
- ඒ නිසා බොහෝවිට මෙම රටවල සංක්‍රමණය උනන්දු කිරීමට සිදුව ඇත. ඒ නිසා උද්ගතව ඇති ගැටලු ද බොහෝය. ජන සමාජයේ සංයුතිය ආශ්‍රිතව නොයෙකුත් ගැටලු පැන නැඟී ඇත. (ලකුණු 06)

6. (i) හරිත විප්ලවය සහ ඓන්ද්‍රීය කෘෂිකර්මය අතර ඇති වෙනස කුමක් ද?

හරිත විප්ලවය යනු මුළුමනින්ම රසායනික ද්‍රව්‍යෝජනමය වශයෙන් වෙනස් කළ බීජ වර්ග පදනම් කර ගත් කෘෂිකාර්මික තාක්ෂණයක් මත පදනම් වූවකි. ඓන්ද්‍රීය කෘෂි කර්මය රසායන ද්‍රව්‍ය භාවිත නොකරයි. පැලැටි වර්ග ජාතමය වශයෙන් වෙනස් නොකරයි පාරම්පරික ගොවිතැන් ක්‍රම (සෞඛ්‍යට හිත කර පරිසරහිතකාමී) භාවිතා කරන්නකි.

(ලකුණු 02)

- ඉහළ අස්වනු ලබා දෙන ජානමය වශයෙන් වෙනස් කළ දෙමුහුන් බීජ භාවිතය
- මේවා රසායනාගාරවල කෙරෙන පර්යේෂණ ඔස්සේ නිෂ්පාදනය කර පසුව කෘෂිකාර්මික අත් හදා බැලීම්. මෙම HYV වර්ගවල අස්වැන්න සම්මුදායික බීජ වර්ගවලට වඩා අඩුකොපමණින් හා තෙතඇයකින් වැඩිය. එසේම මෙම බීජ වර්ග රෝගවලට ඔරෝත්තු දෙන ආකාරයට නිෂ්පාදනය කළ හැකිය.
- කෘත්‍රිම පොහොර භාවිතය. කිසියම් කළ යුතු ක්ෂේත්‍රයකට අඩුම ක්ෂණයකුලට පොහොර යෙදීම අත්‍යවශ්‍යයය. පොහොර නිෂ්පාදය කෙරෙන්නේ රසායනාගාරවලය.
- පලිබෝධ නාශක භාවිතය බෝගවලට වැළඳෙන රෝග සඳහා රසායනික පලිබෝධ නාශක යෙදීම අත්‍යවශ්‍යයය.
- පලිබෝධ නාශක මෙන්ම කෘමි නාශක රසායන යෙදීම අත්‍යවශ්‍යයය
- පාලිත ජල සම්පාදනයක් කළ යුතු ය.
- කලට වේලාවට සහ නිශ්චිත ප්‍රමාණයෙන් පලය සැපයිය යුතුය.
- මෘත්තිකාපරීක්ෂණ සහ නව තාක්ෂණික ක්‍රම භාවිතය.
-

(ලකුණු 04 යි)

(iii) හරිත විප්ලවයෙහි අවාසි තුනක් කෙටියෙන් සාකච්ඡා කරන්න.

බෝග වර්ග කිහිපයකට සීමා වීම. මොනෝ විට අවධානය යොමු වූ ඉරිඟු, තිරිඟු සහ වී බෝග කෙරෙහි ය.

කුඩා, තෙල් ආශ්‍රිත වාණිජයමය බෝග කෙරෙහි අවධානයක් යොමු වූයේ නැත. මෙය ආහාර නිෂ්පාදනය හා සම්බන්ධ වූවක් නිසාය.

භූමිය සහ මිනිස් සෞඛ්‍ය කෙරෙහි අහිතකර ලෙස බලපෑම

කෘත්‍රිම පොහොර සහ අනෙකුත් රසායනික ද්‍රව්‍ය භාවිතය නිසා පසේ ස්වභාවික සරු බව විනාශ විය. තල ළිං මගින් ජල සම්පාදනය සීමාත්මක වූ බැවින් තුනෙ ජල වෙටෙම් පහළ බැස ගියේය. එසේම රසායනික ද්‍රව්‍ය භාවිතය මිනිස් සොඳාට ද අහිත කර වූයේ ය.

කෘෂිකාර්මික යෙදවුම් සඳහා අවශ්‍ය මූලධනය සෝසිය හෙවින්ට නොහිඹිණි. ආර්ථික වශයෙන් දුප්පත් පරිමාවකින් ගොවි බිම් පවත්වා ගෙනයාමට හෙවින්ට විශේෂයෙන්ම කුඩා හෙවින්ට අපහසු විය.

වැඩි වන නිෂ්පාදන පිරිවැය හරිත විප්ලවයේ අවශ්‍යතාවය සඳහා වියදම් දැරිය යුතු වේ.

මෙය විශාල සමාගම්වලට වාසිදායක වූ තාක්ෂණික ක්‍රමයකි.

(ලකුණු 06)

(iv) පෙන්දිය කෘෂිකර්මයෙහි වැඩි අතක් සෑහෙලි කරන්න.


- පෙන්දිය කෘෂි කර්මය පරිසර හිතකාමී හෙවිකැන් ක්‍රමයකි. රසායනික ද්‍රව්‍ය භාවිත නොකරයි. මෙය පාරම්පරික භාවිත ක්‍රමය මත අවධානය යොමු කරයි.
- ශෛල විවිධත්වය වර්ධනය කරයි. රසායනික ද්‍රව්‍ය භාවිත නොකර පෙන්දිය යෙදවුම් ගත නවෝත්තු වීම. එය සාර්ථක කර ගනී සත්ත්ව ශෛල විවිධත්වය වර්ධනය කරයි.
- තිරසාර වූ හෙවි ක්‍රමයකි. සාරවත් පාංශු ස්වභාවයක් පවත්වාගෙන යාමට, ඉහළ අස්වනු ලබා ගැනීමට සහ පරිසර හිතකාමී බව ආරක්ෂා කරගනිමින් ඉදිරියට යයි.

- සොඛ්‍යමය වාසි : ජෛනිදීය වශයෙන් නිශ්පාදිත බෝග වර්ග මනුස්ස සෞඛ්‍යයට හිතකර වේ. රසායනික දුවෘවලින් තොර ආහාර පරිභෝජනයට අවකාශ සැලසෙන බැවින් බොහෝ රෝගවලින් ආරක්ෂා විය හැකිය.
- ගොවින්ට ආර්ථිකමය වශයෙන් හිතකරවූවත් පහසු ගොවිතැන් ක්‍රමයකි. රසායනික දුවය මිලදී ගැනීමට අධික මිලක් වැය කිරීම අනවශ්‍ය හෙයින් ගොවින්ට ඔරෝත්තු දෙන භාවිත ක්‍රමයකි.
- පාංශු සංරක්ෂණය : රසායනික දුව්‍ය භාවිත නොකිරීම දුව්‍ය මත නඩත්තු වීමත් නිසා ස්වාභාවිකත්වය ආරක්ෂා වේ.
- ජල සංරක්ෂණය
  ජෛනිදීය ගොවිතැන් ජල සංරක්ෂණය අවධාරණය කරයි. ස්වභාවික ජල සම්පාදන ක්‍රම මෙය මාරුව, කොල රොඩු බහුල වශයෙන් භාවිතය වැනි ක්‍රම නිසා ජලය ආරක්ෂා කර ගත හැකිය.
- ජානමය වශයෙන් වෙනස් කළ බීජ වර්ග හෝ පැල භාවිත නොකෙරේ.

(ලකුණු 06)

7. පහත 1 රූප සටහන මගින් ශ්‍රී ලංකාවට සංචාරකයින්ගේ පැමිණීම 2001 - 2022 නිරූපණය වේ.

රූප සටහන 1 : ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව, 2001 - 2022



මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, 2023

(i) ශ්‍රී ලංකාවට සංචාරකයින් ආකර්ෂණය කරන ප්‍රධාන සංචාරක පදනම් **දෙක** නම් කරන්න.

1. භෞතික පදනම

2. මානව පදනම

(ලකුණු 02

(ii) ඉහත 1 රූප සටහනෙහි නිරූපිත පරිදි ශ්‍රී ලංකාවට සංචාරකයින්ගේ පැමිණීමෙහි ප්‍රවණතා **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

අවම වශයෙන් ප්‍රවනතා හයක් හඳුනාගත හැකිය

1. ශ්‍රී ලංකාවට සංචාරකයින්ගේ පැමිණීමෙහි උච්චාවචන පවතී
2. 2001 සහ 2004 අතර කාලය තුළ සංචාරකයින්ගේ පැමිණීම අඩු නමුත් සුළු වැඩිවීමක් පෙන්නුම් කරයි
3. 2004 සහ 2008 අතර කාලය තුළ සංචාරකයින්ගේ පැමිණීමෙහි සුළු අඩුවීමක් පෙන්නුම් කරයි
4. 2009 සහ 2018 අතර කාලය තුළ සංචාරකයින්ගේ පැමිණීමෙහි ක්‍රමික වැඩිවීමක් පෙන්නුම් කරයි

CamScanner

5. 2019 සහ 2021 අතර කාලය තුළ සංචාරකයින්ගේ පැමිණීමෙහි දැඩි අඩුවීමක් පෙන්නුම් කරයි
6. 2021 සිට සංචාරකයින්ගේ පැමිණීමෙහි ප්‍රතිසාධන තත්ත්වයක් පෙන්නුම් කරයි

(ලකුණු 06)

(iii) ඔබ ඉහත 7 (ii) හි සඳහන් කළ ප්‍රවණතාවලට හේතු **අනක්** විමසන්න.

1. ශ්‍රී ලංකාවට සංචාරකයින්ගේ පැමිණීමෙහි උච්චාවචන පවතී
   සංචාරක කර්මාන්තය ගෝලීය සහ දේශීය තත්ත්වයන්ට සංවේදී වේ
2. 2001 සහ 2004 අතර කාලය තුළ සංචාරකයින්ගේ පැමිණීම අඩු නමුත් සුළු වැඩිවීමක් පෙන්නුම් කරයි
   ශ්‍රී ලංකාවේ පැවති අස්ථාවර තත්ත්වය
3. 2004 සහ 2008 අතර කාලය තුළ සංචාරකයින්ගේ පැමිණීමෙහි සුළු අඩුවීමක් පෙන්නුම් කරයි
   රටේ සාමකාමී වාතාවරණයක් නොපැවතීම
4. 2009 සහ 2018 අතර කාලය තුළ සංචාරකයින්ගේ පැමිණීමෙහි ක්‍රමික වැඩිවීමක් පෙන්නුම් කරයි
   සංචාරක කර්මාන්තයට උචිත හිතකර තත්ත්වයන් බිහිවීම
5. 2019 සහ 2021 අතර කාලය තුළ සංචාරකයින්ගේ පැමිණීමෙහි දැඩි අඩුවීමක් පෙන්නුම් කරයි
   COVID-19 හි බලපෑම සහ ආර්ථික අර්බුදය
6. 2021 සිට සංචාරකයින්ගේ පැමිණීමෙහි ප්‍රතිසාධන තත්ත්වයක් පෙන්නුම් කරයි
   සංචාරක කර්මාන්තයට හිතකර ආර්ථික සමාජයීය සහ දේශපාලනික තත්ත්වයන් බිහිවීම

(ලකුණු 06)

(iv) ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනයට සංචාරක කර්මාන්තය දායක වී ඇති ආකාරය උදාහරණ **අනක්** සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

1. යටිතල පහසුකම් දියුණුවීම

   මාර්ග, ප්‍රවාහන සහ සන්නිවේදන පහසුකම් දියුණුවීම නිසා සංචාරකයින්ට රට පුරා ගමනාගමනයට පහසුව සැලසේ.

2. ආරක්ෂාව සහ රැකවරණය තහවුරු කිරීම

   සංචාරකයින්ගේ ප්‍රධානම අවශ්‍යතාවක් වන ආරක්ෂාව සහ රැකවරණය තහවුරු කිරීමට ශ්‍රී ලංකාව ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත.

3. දේශීය ව්‍යාපාර ප්‍රවර්ධනය

   ආපනශාලා නවාතැන් පහසුකම් හෝටල් ආදිය වර්ධනය වී ඇත. දේශීය ආර්ථිකයට සහායවී
   සඳහා සංචාරක ව්‍යාපාරිකයින්ගේ දායකත්වය ද, දේශීය ව්‍යාපාරික නිමැවුම් භාවිතය සඳහා
   සංචාරකයින් දිරිගැන්වීම ද දක්නට ඇත.

4. සංචාරක නිපැයුම් ප්‍රවර්ධනය

   සංස්කෘතිය සහ පරිසරය පදනම් කරගත් නිපැයුම් සංචාරකයින්ට සැපයීමට ශ්‍රී ලංකාව විශාල
   ප්‍රයත්නයක් දරයි. විනෝදයෙන් ආශ්‍රිත ක්‍රීඩා භාණ්ඩ, සංස්කෘතික උත්සව ආශ්‍රිත නිපැයුම් සහ

5. නිරසර සංචරණය කෙරෙහි අවධානය යොමු කිරීම

නිරසර සංචරණය සංචාරකයින් අතර බෙහෙවින් ජනප්‍රසාදයට පත්ව ඇත. එබැවින් නිරසර සංචරණය කෙරෙහි අවධානය යොමු කිරීම මගින් පරිසරයට සංවේදී සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකාවට හැකියාව ඇත. එමගින් රටේ ස්වභාවික සම්පත් ආරක්ෂාවට ද උපකාරී විය හැකිය.

6. ප්‍රාදේශීය සංචාරක ආකර්ෂණය ඔස්සේ ප්‍රාදේශීය සංවර්ධන කටයුතු වර්ධනය වෙමින් පවතී.

(උදාහරණ: පින්නවල, දඹුල්ල, යාපනය, පාසිකුඩා, කතරගම, ඇල්ල, හික්කඩුව)

7. කෑලුම් කිණ වහු දිණිදා ලිත්‍රෝසිනාස්

8. පහත වගුව 1 මගින් කලාපීය වශයෙන් ලෝකයේ පෙට්‍රෝලියම් සංචිත ව්‍යාප්තිය දක්වයි.

වගුව 1 : 1992 සිට 2020 දක්වා කලාපීය වශයෙන් ලෝකයේ පෙට්‍රෝලියම් සංචිත ව්‍යාප්ති රටාව,
(මුළු සංචිතයෙහි ප්‍රතිශතයක් වශයෙන්)

ලෝකයේ කලාප	1992	2002	2012	2020
මැදපෙරදිග	63.7	56.1	48.4	48.3
දකුණු සහ මධ්‍යම ඇමෙරිකාව	7.6	7.6	19.7	18.7
උතුරු ඇමෙරිකාව	11.7	17.3	13.2	14.0
යුරෝපය සහ පොදුරාජ්‍ය මණ්ඩලීය නිදහස් රටවල් (CIS)	7.5	8.3	8.4	9.2
අප්‍රිකාව	5.9	7.6	7.8	7.2
ආසියා ඖත්තිකර	3.6	3.1	2.5	2.6
ලෝකය	**100.0**	**100.0**	**100.0**	**100.0**

මූලාශ්‍රය : *https://www.statista.com*

(i) නිෂ්පාදන කර්මාන්ත සහ නිෂ්කර්ෂක කර්මාන්ත අතර වෙනස කුමක් ද? (ලකුණු 02 යි)

නිෂ්පාදන කර්මාන්තයක් යනු අමු ද්‍රව්‍යයක් නිමි භාණ්ඩයක් බවට පරිවර්තනය කිරීමයි.
නිෂ්පාදන කර්මාන්තයක් යනු අමුද්‍රව්‍ය සහ අනෙකුත් සාධක යොදාගෙන භාණ්ඩ නිපදවීම යි.

නිෂ්කර්ෂක කර්මාන්තයක් යනු පෘථිවියේ තැන්පත්ව තිබෙන ඛනිජ ද්‍රව්‍ය කැණීම් මගින් මතුපිටට ගැනීමේ ක්‍රියාවලිය යි.

(ii) ඉහත 1 වගුවේ දත්ත පරිශීලනය කරමින් ලෝකයේ පෙට්‍රෝලියම් සංචිත ව්‍යාප්ති රටාවේ ලක්ෂණ කුනක් විස්තර කරන්න. (ලකුණු 06 යි)

කලාපය සහ කාලය පදනම් කර ගෙන ගතිලක්ෂණ විස්තර කළ හැකිය.

සමස්ථ කාල පරිච්ඡේදය තුළ ඉහළම සංචිතය පවතින්නේ මැද පෙරදිග වුවත් එහි ප්‍රතිශතය පිරිහෙමින් පවතී.

ආසියා ඖත්තිකර කලාපයෙහි අඩුම සංචිතය පවතින අතර එහි ප්‍රතිශතය ද ක්‍රමිකව අඩු වී ඇත.

දකුණු සහ මධ්‍යම ඇමෙරිකාවේ ප්‍රතිශතය දෙගුණයකටත් වඩා වැඩි වී ඇත.

උතුරු ඇමෙරිකාවේ ප්‍රතිශතය උච්චාවචනය වෙමින් පවතී.

යුරෝපය සහ පොදු නිදහස් රාජ්‍යයන්හි (CIS) සංචිතය සුළු වැඩිවීමක් පෙන්නුම් කර ඇත.

අප්‍රිකාව අවම සංචිත සහිත කලාපයක් වන අතර එහි සුළු වැඩිවීමක් පෙන්නුම් කර ඇත.

(48) WWW.PastPapers.WiKi (47)

Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more! CamScanner

(iii) ලෝක පෙට්‍රෝලියම් වෙළඳාමෙහි කැපී පෙනෙන ලක්ෂණ **දෙකක්** විස්තර කරන්න.

ලෝකයේ පෙට්‍රෝලියම් වෙළෙඳාම පාලනය කරනු ලබන්නේ ප්‍රධාන සමාගම් කිහිපයකිනි.

පෙට්‍රෝලියම් වෙළෙඳාම පිළිබඳ ඒකාධිකාරයක් පවත්වාගෙන යාම සඳහා පිහිටුවා ගත් සංවිධාන ද ඇත. උදාහරණ: පෙට්‍රෝලියම් අපනයන කෙරෙන රටවල් සංවිධානය (OPEC)

ජනසංඛ්‍යා වර්ධනය සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ලෝක ආර්ථිකයේ ප්‍රසාරණය වීමත් සමඟ පෙට්‍රෝලියම් සඳහා පවත්නා ඉල්ලුම ඉහළ යයි.

පෙට්‍රෝලියම් නිපදවන සමහර රටවල් පෙට්‍රෝලියම් ආනයනය කරන ප්‍රධාන රටවල් ලෙස ද සැලකේ. උදාහරණ: ඇමෙරිකා එක්සත් ජනපදය සහ චීනය

යුක්‍රේන රුසියා යුද්ධය ගෝලීය පෙට්‍රෝලියම් වෙළෙඳාම කෙරෙහි සෘණාත්මකව බලපා ඇත.

(ප්‍රදාහරණ - හොඳ යුදිබව)

COVID-19 කාල පරිච්ඡේදය තුළ ගෝලීය පෙට්‍රෝලියම් වෙළෙඳාමෙහි සුළු හැකිලීමක් ඇති විය.

සංවර්ධනය වෙමින් පවත්නා රටවලින් පෙට්‍රෝලියම් සඳහා ඇති ඉල්ලුම වර්ධනය වෙමින් පවතින නමුත් වර්තමානයේ පෙට්‍රෝලියම්වල මිල ඉහළ යාම නිසා මවුන් දුෂ්කරතාවලට මුහුණ පා ඇත.

(iv) ලෝකයේ නිෂ්කර්ෂක කර්මාන්ත ආශ්‍රිත ගැටලු **අතක්** සාකච්ඡා කරන්න.

නිෂ්පාදන පිරිවැය ඉහළ යාම
කැණීම් නිසා ඇතිවන පාරිසරික ගැටලු
ප්‍රාන්ත අතර ද ස්වදේශික ජනතාව සහ ආකර සමාගම් අතර ද ඇති වන ගැටුම්
අඩු පිරිවැයක් යටතේ අඩු විමෝචනයක් සහිතව නිෂ්පාදනය කිරීමේ දුෂ්කරතා
ප්‍රාග්ධන පිරිවැය ඉහළ යාම නිසා කැණීම් සඳහා ආයෝජන කිරීමේ දුෂ්කරතා
ආකරවල ගැඹුර වැඩි වීම
සංචිතවල ගුණාත්මක භාවය පිරිහීම
ආකර ආශ්‍රිත අනතුරු වැඩි වීම
මිනිස් බල හානිය සඳහා ඇති ඉල්ලුම අඩු වීම

PAST PAPERS WIKI

Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more! CamScanner